මාධ්‍ය නිකුතුව :-උතුරු පළාතේ ජනතාවට සහ රජයේ නිලධාරීන්ට ඉදිකිරීම් සහ නඩත්තු සහාය සැපයීම සඳහා තනි කවුළු යාන්ත්‍රණ (One Stop Single Window Mechanism) ක්‍රමය.

අරමුණු

- රජයේ ඉඩම් අඩු ආදායම්ලාභීන්ට බෙදා දීම සහ නිවාස ඉදිකිරීම සඳහා තාක්ෂණික සහය ලබා දීම.
- නාගරික සංවර්ධන අධිකාරිය හෝ ආයෝජන මණ්ඩල හරහා කලාප ලෙස ප්‍රකාශ කර පවරා දී ඇති ඉඩම්වල නිවාස ඉදිකිරීම සඳහා ඉල්ලුම්කරුවන්ට අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීම.
- ගොඩනැගිලි ඉදිකිරීම්, වැඩිදියුණු කිරීම් හෝ ගොඩනැගිලි නඩත්තු සේවා අපේක්ෂා කරන උතුරු පළාතේ ඉඩම් හිමියන් ඇතුළු රජයේ සේවකයින්ට මෙම යෝජනා ක්‍රමයෙන් ප්‍රතිලාභ ලබාගත හැකිය.
- ඉදිකිරීම් ප්‍රතිසංස්කරණ හෝ ගොඩනැගිලි නඩත්තු සේවා අපේක්ෂා කරන උතුරු පළාතේ ඉඩම් හිමිකම් ඇති විදේශ රටවල ජීවත්වන ශ්‍රී ලාංකිකයන්ටද ගොඩනැගිලි ඉදිකිරීම්, වැඩිදියුණු කිරීම් හෝ ගොඩනැගිලි නඩත්තු සේවා සඳහා මෙම යෝජනා ක්‍රමයෙන් ප්‍රතිලාභ ලබාගත හැකිය.

ඉල්ලීම් ලැබීමේ ක්‍රියාවලිය, අදාල කරුණු පරීක්ෂා කිරීම සහ පාරිභෝගිකයා සමඟ ගිවිසුමට එළඹීමේ කාලය දින 30ක් නොඉක්මවිය යුතුය.

- මූලික මූලධර්මය නම් මෙම ඉදිකිරීම්, කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA's) ඉදිකිරීම් හා නඩත්තු පිරිවිතරයන්ට අනුකූල වන අතර හරිත හා පරිසර හිතකාමී සංස්කෘතික වටිනාකම් පිළිබිඹු කරන සහ ලාභදායී ප්‍රවේශයන් ඇතුලත් බව සහතික කිරීම.
- මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය ලෙස පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව කටයුතු කරනු ඇත. ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලය, ව්‍යාපෘතියේ අධීක්ෂණ ආයතනය ලෙස ක්‍රියා කරන අතර අධීක්ෂණ කමිටුවට ප්‍රධාන ලේකම්, ආණ්ඩුකාරවරයාගේ ලේකම් හෝ ගරු ආණ්ඩුකාරවරයා විසින් බලය පවරන ලද නියෝජිතයෙකු, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් -ඉංජිනේරු සේවා, පළාත් පලාන කොමසාරිස්, ඉඩම් කොමසාරිස් සහ අධ්‍යක්ෂ - ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ද ඇතුළත් වේ.
- ජාතික ප්‍රසම්පාදන ආයතනය විසින් ප්‍රකාශයට පත් කරන ලද මාර්ගෝපදේශනයේ (Procument Guidelines) 4.3.1 සහ 4.3.2 අනුව උතුරු පළාත් සභාවට ලබාදෙනු සේවාව වෙනුවෙන්, සේවා ගාස්තුව (7% නොඉක්මවන) ලෙස අයකරනු ඇත. අඩු වියදම් ඉදිකිරීම් සේවාවන් වෙනුවෙන් ඉදිකිරීම් සඳහා අය කරන ගාස්තුව 5% නොඉක්මවන අතර දුප්පතුන් සඳහා ගාස්තුව 3% කි. තනි කවුළු යාන්ත්‍රණයේ අනුග්‍රහය යටතේ යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභීන්, පළාත් පාලන ගෙවීම්, කම්කරුවන්, ඉදිකිරීම් සහ ඉදිකිරීම් ද්‍රව්‍ය සඳහා සෘජුවම ගෙවීම් කල යුතුය.

මෙම ක්‍රියාවලිය පහත සඳහන් ප්‍රධාන පියවර වලින් සමන්විත වේ.

- ප්‍රතිලාභීන් පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ඇති සැලසුම්වලින් එකක් තෝරා ගැනීමෙන් හෝ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට තමන්ගේම සැලැස්මක් යෝජනා කිරීමෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් සිතියම් සහ පිරිවිතර අවසන් කිරීම සහතික කරනු ඇත.
- ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය ක්ෂේත්‍ර සමීක්ෂණ, සැලසුම් සහ සිතියම් සකස්කිරීම සිදු කරන අතර පිරිවිතර සහ ප්‍රමාණ රිසිට් පත් සකස් කරයි.
- නාගරික සංවර්ධන අධිකාරිය හෝ පළාත් පාලන ආයතනය විසින් ඉඩම් අයිතිය තහවුරු කිරීම මත සහ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් යෝජිත ව්‍යාපෘතියට, ප්‍රතිලාභියා විසින් ලබා දෙන එකඟතාවය මත අධීක්ෂණ කමිටුව ඉදිකිරීම් සඳහා අවසර ලබා දෙනු ඇත.
- යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභීන් සහ පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව අතර ගිවිසුමකට එළඹීම සිදුකරයි.
- පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද ප්‍රමාණ පත්‍ර මත පදනම්ව අශ්‍ය අමුද්‍රව්‍ය ප්‍රමාණය සහ ශ්‍රම අවශ්‍යතා පිළිබඳ තොරතුරු ප්‍රතිලාභීන්ට ලබා දෙනු ඇත.
- ගොඩනැගිලි දෙපාර්තමේන්තුව තෝරාගත් සැපයුම්කරුවන් හරහා ප්‍රතිලාභීන්ට අවශ්‍ය අමුද්‍රව්‍ය කම්රුවන් සහ යන්ත්‍රෝපකරණ ලබා ගන්නට සහය ලබා දෙයි.
- පිරිවිතර, සිතියම් සහ ප්‍රමාණ පත්‍ර අනුව වැඩ කටයුතු සිදු කිරීම ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂන කර සහතික කරයි.
- තහවුරු කිරීමේ සහතිකය (Certificate of Conformity -CoC) ලබා ගැනීමට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සහාය වනු ඇත.

උනන්දුවක් දක්වන පුද්ගලයින්ට වැඩි විස්තර සඳහා පළාත් අධ්‍යක්ෂ, පළාත් අධ්‍යක්ෂ කාර්යාලය, පළාත් ගොඩනැගිලි දෙපාර් තමේන්තුව, වෙරල පාර, ගුරුනගර්, යාපනය යන ලිපිනයට ඉල්ලුම් කල හැකිය. (දු.අං 0212228091 ෆැක්ස් 0212212700) වැඩ කරන දිනවල පෙ.ව.9.00 සිට ප.ව 3.00 දක්වා කටයුතු කරනු ඇත.

එස්.එම්.සමන් බන්දුලසේන
ප්‍රධාන ලේකම්-උතුරු පළාත,
2022 ඔක්තොම්බර් මස 17 වන දින.